# ඉතිහාසය - 11 වසර


## පිළිතුරු

### <u>I පත්‍රය</u>

| ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරෙහි අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | **3** | 11 | **1** | 21 | **3** | 31 | **2** |
| 02 | **1** | 12 | **3** | 22 | **4** | 32 | **2** |
| 03 | **4** | 13 | **2** | 23 | **2** | 33 | **1** |
| 04 | **3** | 14 | **1** | 21 | **1** | 34 | **3** |
| 05 | **4** | 15 | **1** | 25 | **4** | 35 | **4** |
| 06 | **2** | 16 | **4** | 26 | **3** | 36 | **4** |
| 07 | **3** | 17 | **3** | 27 | **1** | 38 | **2** |
| 08 | **1** | 18 | **2** | 28 | **4** | 38 | **2** |
| 09 | **4** | 19 | **2** | 29 | **1** | 39 | **3** |
| 10 | **4** | 20 | **1** | 30 | **4** | 40 | **4** |

**I කොටස**


1 (අ) (I)



1 (ඇ) (II)



1. (ඇ) (ii)
1. (ஆ) (ii)
1. (a) (ii)



## පිළිතුරු

## <u>II පත්‍රය</u>

**01.** (අ)

I. ආදර්ශ ලංකා සිතියමේ ලකුණු කර ඇත. (ලකුණු 1 × 12 = 12)

II. ආදර්ශ ලෝක සිතියමේ ලකුණු කර ඇත. (ලකුණු 1 × 6 = 6)

(ආ) **(I)**

A. නිශ්ශංකමල්ල රජු/ කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල

B. වොහාර

C. ෆ්ලෝරන්ස් නගරය

D. වින්ස්ටන් චර්චිල් (ලකුණු 1 × 4 = 4)

**(II)**

1. දේව දරුවෝ
2. රෆායල්/ රෆායල් සැන්ඩි
3. පුනරුද සමයේ/ නූතන යුගයේ
4. සිස්ටයින් දෙව්මැදුර (ලකුණු 1 × 4 = 4)

**(III)**

1. 16 ලුවී රජු
2. ප්‍රංශ විප්ලවය
3. බුර්බෝන්
4. ස්ටේට්ස් ජෙනරල් සභාව (ලකුණු 1 × 4 = 4)

### II කොටස

**02.**

**(I)** A. නිකාය සංග්‍රහය

B. තඹ මස්ස

C. පනාකඩුව තඹ සන්නස (ලකුණු 1 × 3 = 3)

**(II)** සිලප්පාදිකාරම්, මනිමේකලෛයි, පදිර්රුපත්තු, පට්ටිනප් පාලෛයි (ලකුණු 2 × 2= 4)

**(III)**

I. ජනතාවගේ නිර්මාණාත්මක හැකියාවන් දැන ගැනීමට

II. වාස්තු විද්‍යාව පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට

III. ශිල්පීය නිපුණතා පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට

IV. ජල සංරක්ෂණය පිළිබඳ දැනුමක් ලබා ගැනීමට

V. පරිසර සංරක්ෂණය පිළිබඳ දැන ගැනීමට (ලකුණු 2 + 3 = 5)

**(IV)**

I. අඛණ්ඩ ඉතිහාසයක තොරතුරු අන්තර්ගත වීම

II. පෙර ලියූ වංශකතාවල අඩුපාඩු මගහරවා ලියා තිබීම

III. කලානුරූපීව ඓතිහාසික සිදුවීම් පෙළගස්වා තිබීම

IV. මහා වංශයේ එන කරුණු වෙනත් මූලාශ්‍ර වලින් සනාථ වීම

V. ආර්ථික, දේශපාලන, ආගමික තොරතුරු රැසක් දැන ගැනීමට හැකිවීම (ලකුණු 3 + 3 = 6)

**03.**

**(I)** I. අහාර සුලභ වීම

II. ජල පහසුකම්

III. පාෂාන ව්‍යාප්තිය

IV. වර්ෂා කාලයේ දී ගල්ගුහා හා වියළි කාලයේ දී එළිමහන් වාසස්ථාන තෝරා ගැනීම

(ලකුණු 1 × 3 = 3)

**(II)** <u>ශිලා මංජුසා</u>

- ඉබ්බන්කටුව
- යටිගල්පොත්ත
- ගල්සොහොන්කනත්ත

<u>මැටි ඔරු සුසාන</u>

- රංචාමඩම
- බෙරගල
- හල්දුම්මුල්ල (ලකුණු 2 × 2 = 4)

**(III)** I. නිවාස තාක්ෂණය

II. ලෝහ තාක්ෂණය

III. මැටි බඳුන් තාක්ෂණය

IV. රූපලාවන්‍ය තාක්ෂණය

V. පබළු තාක්ෂණය (ලකුණු 2 + 3 = 5)

**(IV)** I. වාර්ෂික වර්ෂාපතනය

II . භූ විෂමතාව

III. පසේ ස්වභාවය

IV. ජලවහනය

V. ස්වභාවික සම්පත් වල ව්‍යාප්තිය (ලකුණු 3 + 3 = 6)

**04.**

**(I)** I. මැටි ඔරු සුසාන

II. නිවාස ඉදිකිරීම්

III. මැටි බඳුන් නිපදවීම (ලකුණු 1 × 3 = 3)

**(II)** A. පීඩන ශල්කනය

B. අඩික

C. රුවන්වැලිසෑය

D. ආලාහන පිරිවෙන (ලකුණු 1 × 4 = 4)

**(III)**

I යබොර කැබැල්ලක් බෙරගලින් හමුවීම

II සමනල වැව ප්‍රදේශයෙන් යපස් උණුකරන උඳුනක් හමුවීම

III සීගිරිය අලකොළ වැව ප්‍රදේශයෙන් හමු වූ සාක්ෂි (ලකුණු 2 + 3 = 5)

**(IV)** <u>වෛද්‍ය සේවාවන්</u>

I පණ්ඩුකාභය රජු සිවාකා ශාලා නමින් ගොඩනැගිල්ලක් ඉදි කිරීම

II දුටුගැමුණු රජු රෝහල් 18 ක් ඉදි කිරීම

III ආලාහන පිරිවෙනෙන් හමු වූ පුරාවිද්‍යාත්මක සාක්ෂි

IV ඔසු උයන්, රෝහල් නටඹුන්, වෛද්‍ය පොත් හා බෙහෙත් ඔරු හමුවීම

<u>සනීපාරක්ෂාව</u>

I වැසිකිලි කැසිකිලි නටඹුන්

II අනුරාධපුර හා පොළොන්නරු නගර වල අපවිත්‍ර ජලය බැහැර කිරීමේ කානු පද්ධති සකස් කිරීම

(සනීපාරක්ෂාව හා වෛද්‍ය ක්‍රම යන මාතෘකා දෙකෙන් අවම වශයෙන් එක් පිළිතුරක් හෝ තිබිය යුතුය)

(ලකුණු 3 + 3 = 6)

**05.**

**(I)** A. සේනාසම්මත වික්‍රමබාහු

B. යමසිංහ බණ්ඩාර

C. II රාජසිංහ (ලකුණු 1 × 3 = 3)

**(II)** මහාධිකාරම්වරු, දිසාවේවරු, මහලේකම්, බද්දේලේකම්, භාණ්ඩාගාරික (ලකුණු 1 × 4 = 4)

**(III)**

I අධිකරණයේ ඉහළම බලතල රජු සතුවීම

II සෑම නිලධාරියෙකුටම තම පදවිය මත අධිකරණ බලය හිමි වීම

III රජු විසින් විසඳන නඩු වර්ග

IV විවිධ දඬුවම් ක්‍රම (ලකුණු 2 + 3 = 5)

**(IV)**

I පරිභෝජනය පදනම් කරගත් ස්වයංපෝෂිත කෘෂි ආර්ථිකයක් පැවතීම

II වී වගාව සීමා සහිත වූ අතර හෙල්මළු ක්‍රමයට වගා කිරීම

III හේන් ගොවිතැන ප්‍රධාන වීම

IV විවිධ ධාන්‍ය වර්ග, අල බතල, ගෙවතු භෝග හා එළවළු පළතුරු වගා කිරීම

V යකඩ, ලෝහ, ලාක්ෂා හා පන් කර්මාන්තය පැවතීම

VI සත්ව පාලනය පැවතීම (ලකුණු 3 + 3 = 6)

**06.**

**(I)** කෝල්බෲක්, කෲව් මැකලම්, මැනිං (ලකුණු 1 × 3 = 3)

**(II)** A. ජේම්ස් පීරිස් මහතා

B. පොන්නම්බලම් අරුනාචලම් මහතා

C. පොන්නම්බලම් රාමනාදන් මහතා

D. මහත්මා ගාන්ධිතුමා (ලකුණු 1 × 4 = 4)

**(III)** I සර්වජන ඡන්ද අයිතිය

II විධායක කාරක සභා ක්‍රමය (ලකුණු 2 + 3 = 5)

**(IV)** I අග්‍රාණ්ඩුකාරවරයා

II ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව

III අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය

IV අධිකරණ කටයුතු (ලකුණු 3 + 3 = 6)

**07.**

**(I)** කෝපි, කොකෝවා, සිංකෝනා, තේ, රබර් (ලකුණු 1 × 3 = 3)

**(II)** A. රාජකාරි ක්‍රමය

B. එඩ්වඩ් බාන්ස්

C. ජේම්ස් ටේලර්

D. නඩේසර් අයියර් (ලකුණු 1 × 4 = 4)

**(III)**

I නව ඉඩම් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම

II අනිවාර්ය රාජකාරී ශ්‍රම ක්‍රමය අහෝසි කිරීම

III ඉතිරි කිරීමේ බැංකුවක් ආරම්භ කිරීම

IV ශ්‍රමයට මූල්‍යමය වටිනාකමක් ලබා දීම

V දකුණු ඉන්දීය ශ්‍රමිකයන් අඩු වැටුපකට ගෙන්වා ගැනීම (ලකුණු 2 × 3 = 5)

**(IV)** <u>හිතකර :-</u>

I ඉංග්‍රීසි භාෂා දැනුම ප්‍රචලිත කිරීම

II යටිතල පහසුකම් දියුණු වීම

III පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

IV අපනයන වැවිලි බෝග හඳුන්වාදීම

V කාර්මික විප්ලවයේ බලපෑම

<u>අහිතකර :-</u>

I බටහිර සංස්කෘතිය රටතුළ ප්‍රචලිත වීම

II මද්‍යසාර භාවිතය

III ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම

IV ස්වයංපෝෂිත ආර්ථිකය බිඳ වැටීම

V ගම්සභා වැනි ආයතන බිඳ වැටීම (ලකුණු 3 + 3 = 6)

(අවම වශයෙන් එක් අංශයකින් එකක් හෝ අනිවාර්යයෙන්ම ලිවිය යුතුය)

## III කොටස

**08.**

**(I)** පේෂ කර්මාන්තය, යකඩ හා වානේ කර්මාන්තය, ගල්අඟුරු කර්මාන්තය (ලකුණු 1 × 3 = 3)

**(II)**

I ජනගහනය වර්ධනය වීම

II මහා පරිමාණ කර්මාන්ත සඳහා ධනය ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් සිටීම

III ගල් අඟුරු, යපස් වැනි ස්වභාවික සම්පත් තිබීම

IV විද්‍යාත්මක දැනුම

V වැඩිම යටත් විජිත හිමිකරුවා වීම නිසා විදේශ වෙළෙඳපොළක් තිබීම

VI ඉඩම් කොටු කිරීමේ ක්‍රමය

VII රටේ දේශපාලන ස්ථාවරත්වය

VIII ව්‍යාපාර සඳහා ප්‍රාග්ධනය සපයන බැංකු හා මූල්‍ය ආයතන තිබීම (ලකුණු 1 × 4 = 4)

**(III)**

I යුරෝපා රටවල ජනගහනය වර්ධනය වීම

II ජර්මනිය, ප්‍රංශය වැනි රටවල ස්වභාවික සම්පත් හමුවීම

III යුරෝපයේ ප්‍රවාහන පද්ධතිය දියුණු වීම

IV සෙසු යුරෝපා රටවලට ද යටත් විජිත හිමිවීම නිසා විදේශ වෙළෙඳපොලක් තිබීම

(ලකුණු 2 + 3 = 5)

**(IV)** <u>හිතකර :-</u>

I වෙළෙඳ හා වාණිජ කටයුතු ආර්ථිකයේ ප්‍රමුඛයා වීම

II ආනයන අපනයන වෙළෙඳ ආර්ථිකය

III රැකියා අවස්ථා බිහිවීම

IV බද්ද සමාගම් බිහි වීම

V බැංකු රක්ෂණ ක්‍රම බිහිවීම

VI උසස් ජීවන තත්වයක් හිමිවීම

<u>අහිතකර :-</u>

I පරිසරය දූෂණය

II ශ්‍රමය සූරා කෑම

III ගෘහ කර්මාන්ත බිඳ වැටීම

IV පංති සහිත සමාජයක් බිහිවීම

V නව අධිරාජ්‍යවාදය (ලකුණු 3 + 3 = 6)

(අවම වශයෙන් එක් අංශයකින් එකක් හෝ අනිවාර්යෙන්ම ලිවිය යුතුය)

**09.**

**(I)** ජපානය, ජර්මනිය, ඉතාලිය (ලකුණු 1 × 3 = 3)

**(II)** A. II විලියම්

B. වුඩ්රෝ විල්සන්

C. හිට්ලර්

D. මාෂල් ටිටෝ (ලකුණු 1 × 4 = 4)

**(III)**

I නට්සිවාදය නම් ආඥාදායක දේශපාලන සංකල්පය ක්‍රියාත්මක කිරීම

II පෝලන්තය, චෙකොස්ලෝවැකියාව, ඔස්ට්‍රියාව, සාර් නිම්නය... යන රටවල් හා ප්‍රදේශ ආක්‍රමණය කිරීම

III එස් එස් නමින් රහස් හමුදාවක්, ගෙස්ටාපෝ නමින් රහස් පොලිසියක් ගොඩ නැගීම

IV දුඹුරු කමිස හමුදාවක් නිර්මාණය කිරීම

V ජර්මන් ජනතාවගේ මූලික අයිතිවාසිකම් සම්පූර්ණයෙන්ම අහුරා දැමීම

VI යුධ ආයුධ අතින් ජර්මනිය ශක්තිමත් කිරීම

VII යුදෙව්වන් හා කොමියුනිස්ට්වාදීන්ට දරුණු වද හිංසා ලබාදීම

VIII වර්සායි ගිවිසුමේ වගන්ති කඩකරමින් කටයුතු කිරීම (ලකුණු 2 × 3= 5)

**(VI)**

I ලොව මෙතෙක් ඇති වූ බිහිසුණුම සංග්‍රාමය වීම

II ජර්මනිය විනාශ වීම (දෙකඩ වීම)

III මෙතෙක් ලෝක බලවතුන් වූ බ්‍රිතාන්‍ය හා ප්‍රංශයට එම තත්වය අහිමිවීම හා ඔවුන්ගේ අධිකරාජ්‍යය බිඳ වැටීම

IV ඇමරිකාව හා රුසියාව ලෝක බලවතුන් වීම

V ධනවාදී හා සමාජවාදී බල කඳවුරු නිර්මාණය වීම

VI නිරවි යුද්ධයක් ඇතිවීම

VII එක්සත් ජාතීන්ගේ සංගමය ආරම්භ වීම

VIII බ්‍රිතාන්‍ය හා ප්‍රංශය සතු යටත් විජිත නිදහස් රාජ්‍යයක් බවට පත් වීම (ලකුණු 3 + 3 = 6)